## අවුරුදු තිස් තුනකට පසු....
## වොල්ගා නදිය ළඟ,

අතීතයෙන් බිඳක්
වර්තමානයට ගෙන......
හිත රිද්දා ගනිමින්
නැවතත් සිහියට නැගුවේ
හරියටම... අද වැනි සීතලම.... සීතල
හිම වැටෙන දවසක
නුඹත් මාත්.... හමු වූ හැටි.....

වසන්තයෙන් පසු.... හිම වැටෙනා
මේ සීතලම සීතල හිමිදිරියේ
නුඹ මට මුණ ගැසුණා....
පොත් ටිකත් තුරුළු කරන්
"වොල්ගා" නදියට යාබදව
හරියටම 1972 වසරේදීය....

බිරියෝසා ගස් වලට හිම පතිත වී.....
මුළු ලෙනින් ශෘඩයම හරිම සුන්දරයි...
රතු චතුරශ්‍රයේ... අවට පෙදෙසේ... තිබූ
නුඹගේ ඔය සුවඳ,
අදටත් මගේ හද සුවපත් කරයි.
ඒ සුවපත් වීම.... සමගම
අපි හමු වූ හැටි තාමත් .... ඒ ලෙසින්ම
මගේ මතකයට නැගේ.

හැමදාම සීතලම.... සීතල උදයේ
"වොල්ගා" නදියට යාබදව....
දවසක්, දෙකක්, සතියක්, මාසයක්
කථා නොකරම, අපි එකිනෙකාගේ
ඇස් වලින් හිනා වූ හැටි,
ඇස් වලින් කථා කරපු හැටි,
පසුව.... මා නුඹගේ පසු පසින් ඇවිදින්
නුඹගේ වත ගොත මා අසාගත් හැටි...
හරිම සුන්දරයි... යෞවනය
හරිම මනස්කාන්තයි... යෞවනය
කවදා නම් ඒ කාලය.... ආයිත් නම් ඒවිද.....

ආත්ම ගණනක් ඇසුරු කළ මෙන්
අපි එකිනෙකාට කුළුපග වූ හැටි
ආදරයෙන්... මුසපත් වී......
ආදරය බෙදා ගත් හැටි,
ඒ... ආදරය මම දැක්කේ
හරියට ලෙනින් ශෘඩයට වැටෙන...
සුදුම....සුදු... සුසුනිඳු
හිම කැටියක් ලෙසින්....
සරසවියේ පංති නිම වී....
මා නුඹ එනතුරුත්.... නුඹ මා එනතුරුත්....
නොවියසිල්ලෙන් බලන් හිටපු හැටි
මතකයට නැගෙන විට,
ඇසටත් හොරා කඳුළු බිඳු.... රූරා වැටේ
හරිම අව්හිංසක.... නිකළැල් ආදරයක්....

බිහිසුණු ධාරානිපාත... වරුසාවක්
එක පාරට ඇවිත් ගියා වගේ
අපේ ආදරයටත්.... අකුණු ගැසුවේ......
අපටත් නොදැනීම
අවුරුදු (හතක) සුන්දර ආදරය අප අතරින්
ටිකෙන්.... ටික සුණු විසිණු... වෙන්න පටන්
ගත්තේ
අපේ හිතටත්.... හොරාය.

කාලය ඉක්මණින් ඉගිල ගිය අතර
සරසවියේ අන්තිම වසරේ....
"වොල්ගා" නදිය ළඟදී....
සදහටම ඔබ... මගෙන් වෙන්විය.
ඇයි ඔබ එසේ කළේ.... මෙහෙම
අවුරුදු (හතක) ප්‍රේමණීය
සුන්දර..... මතකයන්
නුඹ මගෙන්....
ක්ෂණයකින් උදුරා ගත්තා නොවේද?
අදටත් මා... නුඹ එනතුරු
මේ... නිසළ "වොල්ගා" නදිය ළඟ
සදහටම බලා... හිඳිමි.....

අවුරුදු තිස් තුනකටත්......පසුව
මේ නිසළ "වොල්ගා" නදිය ළඟ
තවමත් මම.... නුඹ එනතුරු.... බලා හිඳිමි.....

**'නිලාන්' මාගම්පිටිය** Sydenham

# පහන් වැට

සංස්කරණය
මෛත්‍රී ප්‍රසාද් ජයවර්ධන

## විරාගය

මා
ජීවිතය දෙස හැරී බැලුවෙමි,
ගෙවූ සුන්දර අතීතය
ඒ නුරාගී යොවුන් විය
අද මා ඉදිරියේ
ගැඹුරින් රැඳුණු
අතීත මතකයක් පමණයි.
සැහැල්ලු, සුන්දරත්වය
නොතේරෙන තරමටම
මගේ හිත වියැකිලා..
උතුම් ආදරයකට
හිමිකම් කියපු මා හට
ඒ ආදරයෙන්ම
වියැකෙන්න සිදුවෙලා..
මම තරහා නැහැ,
අිදරයේ උන්මන්තකයෙක්
කළාට
පරාජිතයෙක් ලෙස අතරමං කළා ට
හිස් නොවූ බලාපොරොත්තු
මා ජීවත් කරවූවා
වැඩි දෙයක් නොව
මා ළඟ දැවටෙන්න,
උණුසුමට තුරුල් වෙන්න
නැවත එයි කියා...
ගතද සිතද දුර්වලයි
තවත් නම් වාරු නැත..
තව ටික කාලයයි
ලෝකෙටම සමුදෙන්න වෙයි
ඒත්...
හිස් අතින් නොව,
පුංචි බලාපොරොත්තුවක්
ආයාචනයකුත් සමඟින්,
උපදිනා හැම ආත්මෙකම
ඔය හිතේ
මට විතරක්ම ඉඩ තියන්න..

**අනුරාධා වික්‍රමසිංහ**
Maidstone



## අත්තටු තිබුණා නම්..

දස මස කුසලා මා වැදූ අම්මේ
ලේ කිරි කරලා මා හට පෙව් අම්මේ
වෙන්වී සයුරෙන් එතෙර මා පැමැණියත් අම්මේ
ඔබේ කිරි සුවඳ මට දැනෙනවා අම්මේ

දුරකථනයකින් හෝ ලිපියකින් ඔබ අමතන විට අම්මේ
ඉගිලෙන්නට හිතයි ඔබෙ තුරුළට අම්මේ
එනමුත් දුරයි එය කළ නොහැකිය අම්මේ
හීනෙන් හෝ පොඩි දුව එනවා
ඔබෙ තුරුලට අම්මේ

කුරුල්ලලෙක් වෙලා පියඹමි ඔබෙ ගෙපැල වෙත අම්මේ
පෙරදා මෙන් ද්වේ කියා මා අමතනවද අම්මේ
ජීවිත ගමනේ මට මව් පදවිය ලැබුණු දිනේ දී අම්මේ
නුඹේ අගේ මට දැනුණා අම්මේ

**සිදා මාටින්ස්ටයින්**
බොල්වින්

හුදෙකලා ඔබ....
මොන තරම් සොඳුරුද?....
බොහෝ තරමට ආදරය කළ
සියළු දේ මා අතැ'ර ගිය කළ
විරහ හදවත තුරුළු කොට
ගෙන
මගේ හිත ළඟ දයාබර වුණු....
සෙනෙහෙවත් සිත එදා මෙන්මයි
නුඹට පෙම් බැඳි
මමත් එහෙමයි....
හුදෙකලාව ඔබ
මොනතරම් සොඳුරුද?.....

**මේනකා ජයතිලක**
ක්වීන්ස්ලන්තය

## අම්මාට ඇමතුමක්

පනස්විය පිරුණ දින
අම්මාට ඇමතුවෙමි
වෙනදාට වඩා සෙනෙහසක්
ජීවයක්
ඇගෙ හඬෙහි අත් වින්දෙමි

**ගාමිණී ලක්ෂ්මන් ගමගේ**
හැම්ප්ටන් පාක්

## අහිමි සම්පත්

මා කුසට මව් වෙන්න
වරම් නැති සාපයට
උණු කඳුළු දිය කරන
දිගු රැයක් හැම දිනම
බිත්තියේ එල්ලවූ
සිඟිතියකගෙ රූපයක්
සිනාසෙයි මා සමඟ
බිළිඳෙකු තොර කාමරේ
කළලයක් නොමැති කුස
හිස්ව තැවෙනා කලට
දරු ගැබක් දරන කුස
සිනාසෙයි
ඔච්චමට..

**රමණී පෙරේරා**
බන්ධූරා වික්ටෝරියා

## ඕනෑ කර තිබේ

මෙතෙර පුරවැසිකම හිමි
ලක්ෂයක වැටුප් ලබන
ඉතා කඩවසම්
උගත්, ගුණවත් පුතුට
විවාහය සඳහා
ඕස්ට්‍රේලියාවේ පදිංචි
යුවතියක් උවමනා කර තිබේ.

දිගු වරල සහ
මුදු පැවතුම් ඇති
කරුණාබර හදවතක්
දායාද කොට ගත්
සිංහල කමින් සුසැදි
සුවිනීත කුමරියකටයි
මේ ආදරණීය ඇරයුම.

ගේ දොර වැඩට නොමැලි
වැඩිහිටියන්ට ගරු කරන
හෙල බස හොඳින් හසුරණ
ආගමට ලැදි අයෙකු විශේෂයි.

කොලු තාලයට දඟලන
දඩි බිඩි ගා ඇවිදින
කතුරු මෙන් දොඩවන අය
කරුණාකර නොලියන්න.

ආරංචියක් සපයන්නෙකුට
මිලියනයක් තෑගි !

**ශ්‍රියානි පෙරේරා**
මෙල්බර්න්



## ලද දෙයින්...

නොලැබුණත් අහිමි දේ
ලැබුණානෙ බොහෝ දේ
ජීවිතය ජය ගන්ට
ලද දෙයින් තුටු වෙන්ට

තටු නැතත් ඉගිලෙන්ට
පිල් නැතත් විහිදන්ට
යහ ගුණය වපුරන්ට
හැකි වේවි බැබැලෙන්ට

**චන්ද්‍රාණි රාජකරුණා**
තෝමස්ටවුන්



## දයාබරියකි මා පැතූ

නොපැතුවත් ලබා ඇති දිළිඳුකම අබියසදි
කොපුල්තල දිලිසුණි ද නෙත් වෙලා කඳුලින්ම
රස පහස පැතූවත් හද ඇගේ නොහඳුනන
මස්, ලේ ම ඉල්ලත් දි ගොළු වුණි ද ඇය තවත්

නෙත් කෙවෙනි බොඳ වුණත් එරෙහි වී බමන මත
ශාලාව කෙළවරක රඟන ඇය දුටු මතින්
ඇරයුමක් නෙත් කොණින් කළත් මා නොදැනීම
පිපාසාවෙන් නොවෙයි දැක ඇයගෙ ගත දිලෙන

ඇරයුමෙන් මා එදා එකඟ වුව නිහඬවම
පතිනියක නොවුවත් යහන මත නොකැළැල්වූ
නොසිතුවෙමි දිනෙක මා දිවිය සපුරණු ඇතැයි
සොම්නසින් හද පිරුණු සමග වූ යස ඉසුරු

අහිමි වූ සෙනෙහසක කටුක බව මෙනෙහිවන
මග වියලි කතරක්ව දිය නොදුටු කිසිදාක
පොලොව මත ජීවිතය මහමෙරක් සේ දැනුණු
කෙම්බිමක් වේ ය මට දයාබරියේ මතු ව

**ධර්ම කොඩිප්පිලි**
ක්රේගිබර්න්

### පින් ලබනා දෙවිඳුනේ

| | |
|---|---|
| පිහිටි කන්දෙ වැඩ සිටිනා කදිර දේව | සාමිනේ |
| මුහුණ සයට නොපෙනුනාද ත්‍රස්තවාදී | කලවිනේ |
| චක්‍රායුධෙ සුරතට ගෙන නැග මයුරා | වාහනේ |
| ගොසින් එකෙක් නෑර නසනු ත්‍රස්තවාදී | යාපනේ |
| සසුන රකින විෂ්නු දෙවිඳු වැඩ හිඳ | ගුරුලාසනේ |
| නොපෙනුනාද ඔබ දෙනෙතට අද සිදුවන | මේ විනේ |
| මිසදිටුවන් අදමිටුවන් වනසන හැටි | සාසනේ |
| පර සක්වල ගසා ඔවුන් රැකදෙනු බොදු | සාසනේ |
| සුදු ඇතුපිට සැරිසරණා දෙව්දුනි සිරි පා | හිමේ |
| නොදුටුවාද පවිටු දණන් වනසන සිරි පා | හිමේ |
| වනසන්නට නොදි එලෙස වටිනා සිරි පා | හිමේ |
| කරුණාවයි සමන් දෙවිඳ රැකදෙනු සිරි පා | හිමේ |

**ධර්මවර්ධන රණසිංහ**